# මීගමුව මහා නගර සභාව

# ටෙන්ඩර් දැන්වීමයි

මීගමුව මහා නගර සභාව මගින් පහත දැක්වෙන උපලේඛනයන්හි වූ බදුකර 2026.01.01 සිට 2026.12.31 දක්වා වසරක කාලයකට බදු දීම සඳහා ජාතික තරගකාරී ක්‍රමය යටතේ මිල ගණන් කැඳවනු ලැබේ.

**උපලේඛනය 01**

| අනු අංකය | බදුකර නම | අවම ටෙන්ඩර් මුදල (වාර්ෂික) | ලංසු ඇපකරය | ටෙන්ඩර් අයදුම්පත් ගාස්තුව |
|---|---|---|---|---|
| 01 | කිමච්චෝඩය බදදූ පොළ බදු දීම | 19,164,600.00 | 380,000.00 | 3,000.00 |
| 02 | කාමච්චෝඩය ඉරිදා පොළ බදු දීම | 21,894,600.00 | 437,000.00 | 3,000.00 |
| 03 | සෙනසුරාදා රාත්‍රී පොළ බදු දීම | 18,564,000.00 | 370,000.00 | 3,000.00 |
| 04 | කොච්චිකඩේ ඉරිදා පොළ බදු දීම | 3,276,105.00 | 65,000.00 | 3,000.00 |
| 05 | අලියාපොළ දිනපතා පොළ බදු දීම | 371,000.00 | 7,000.00 | 3,000.00 |
| 06 | බී සාප්පු සංකීර්ණය පිටුපස වැසිකිළි පද්ධතිය | 172,000.00 | 3,000.00 | 3,000.00 |
| 07 | මීගමුව ප්‍රධාන බස් නැවතුම්පල අසල වැසිකිළි පද්ධතිය | 1,400,000.00 | 28,000.00 | 3,000.00 |
| 08 | පරණ හලාවත පාර රථගාල | 960,000.00 | 19,000.00 | 3,000.00 |
| 09 | නව උසාවි සංකීර්ණය අසල රථගාල | 1,320,000.00 | 26,400.00 | 3,000.00 |
| 10 | මීපුර සිනමාහල පිටුපස ඉඩමේ තෙල් බෙදහැරීමේ මධ්‍යස්ථානය | 840,600.00 | 16,000.00 | 3,000.00 |
| 11 | කාමච්චෝඩය සතිපොළ ඉදිරිපිට ඇති රථගාල බදුදීම | 428,000.00 | 8,000.00 | 3,000.00 |
| 12 | මීගමුව පමුණුගම ප්‍රධාන පාරේ රථවාහන ගාස්තු අයකිරීම | 800,000.00 | 16,000.00 | 3,000.00 |

ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරීම - 2025.10.22 දින සිට 2025.11.06 දින ප.ව. 3.00 දක්වා මීගමුව මහා නගර සභා ගණකාධිකාරී අංශයෙන්

ටෙන්ඩර් අයම්පත් භාර ගැනීම අවසන් කිරීම - 2025.11.07 දින පෙ.ව. 10.00 එම වේලාවෙන් පසු ඉදිරිපත් කරනු ලබන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කිරීම - 2025.10.07 දින පෙ.ව. 10.05ට

කොන්දේසි

1. සෑම ලංසුවක්ම ඒවා බදු දෙනු ලබන දින සිට වර්ෂයක කාලයට නිත්‍යානුකූලව වලංගු වන්නේය.
2. මිල ගණන් ඉදිරිපත් කළ හැක්කේ ශ්‍රී ලංකා පුරවැසියන්ට පමණි.
3. අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ ආකෘති පත්‍ර ගාස්තුව හා තැන්පත් මුදල ගෙවීමෙන් පසුව වේ.
4. අයදුම්පත සමග නිකුත් කරනු ලබන කොන්දේසිවලට එකඟව ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.
5. ලංසු ඇපකරය මුදලින් හෝ මාස 06ක් වලංගු බැංකු ඇපකරයක් මගින් විය යුතුය.
6. ජයග්‍රාහී ටෙන්ඩර්කරුවන් විස්තරාත්මක ටෙන්ඩර් කොන්දේසිවල සඳහන් පරිදි සති 02ක් තුළ මුදල් තැන්පත් කර ගිවිසුමකට එළඹිය යුතුය.
7. ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ආකෘති පත්‍ර නිවැරදිව සම්පූර්ණ කර තැන්පත් ලදුපත මුල් පිටපත අමුණා මුල් පිටපත, අනු පිටපත වෙන වෙනම ලියුම් කවරවල බහා කවරයේ ඉහළ වම් කෙළවරේ බදුකරයේ නම සහ මුල් පිටපත හෝ අනු පිටපත යනුවෙන් සඳහන් කර නාගරික කොමසාරිස්, මහනගර සභාව, මීගමුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් නියමිත දින, නියමිත වේලාවට ලැබෙන සේ එවීම හෝ පැමිණ නාගරික කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ හැකිය. වැඩි විස්තර නාගරික ගණකාධිකාරී (031-2281987) මගින් දැන ගත හැක.
8. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ ලිඛිත අවසරය ඇති අයෙකුට සහභාගී විය හැකිය.
9. මෙම ටෙන්ඩර් සම්බන්ධයෙන් අවසාන තීරණය නාගරික කොමසාරිස් සතුවේ.

**2025.10.17**
**මීගමුව මහ නගර සභා කාර්යාලයේදී**

**නාගරික කොමසාරිස්,**
**මහ නගර සභාව, මීගමුව.**